www.danaparamitha.com

Email: danaparamithawa@gmail.com

අතිපූජ්‍ය නායක හිමිපාණන් වහන්ස/භාරකාර මණ්ඩලයේ සභාපති තුමනි,

## ආරණ්‍ය සේනාසන වලට දානය ලබා දීම සඳහා වන වෙබ් පිටුව

ලෝකවාසි සියලු ම බෞද්ධ ජනතාවට ලෝකයේ කොතැනක සිටියත් පිළිවෙත් පුරමින් අප සසුන රකින ස්වාමීන් වහන්සේලාට දන් දී පින් රැස් කර ගැනීමට හැකි වන පරිදි වැඩ පිළිවලක් සකසමින් ඇත. මෙය සිදු වන්නේ මෙලෙස ය.

1. අප විසින් www.danaparamitha.com නමින් වෙබ් පිටුවක් ආරම්භ කර ඇත. දානය ලබා ගැනීමට කැමති සහ ශ්‍රී ලංකා බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි සියලුම ආරණ්‍ය සේනාසනවල නම් මෙම වෙබ් පිටුවට ඇතුලත් කරනු ලැබේ. (බෞද්ධ කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි ආරණ්‍ය සේනාසන පමණක් මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි කරන බව කරුණාවෙන් සලකන්න).

2. එම එක් එක් ආරණ්‍ය සේනාසන සඳහා එක් එක් මාසයට දින දර්ශනයක් සකස් කරනු ලැබේ.

3. දානයක් දීමට කැමති පින්වතුන්ට මෙම දින දර්ශනය භාවිතා කර තමන් කැමති දිනයක දානයක් ලබාගැනීමට ඉල්ලුම් කල හැක.

4. අදාල ආරණ්‍ය සේනාසනවල වගකිවයුතු පුද්ගලයකුගේ ආධාරයෙන් එම ඉල්ලුම් කරන දින එම ඉල්ලුම් කරන අයට දානය භාර ගත හැකිද යන වග තහවුරු කර ගනු ලැබේ.

5. ආරණ්‍යයට සම්බන්ධ යම් පුද්ගලයකු විසින් එම දිනයේ දානය එම ඉල්ලුම් කරන පුද්ගලයාට ලබා දිය හැකි බව හෝ නො දිය හැකි බව වෙබ් අඩවියේ ලකුණු කල යුතුයි. ( මේ සම්බන්ධයෙන් දැනුම අප විසින් ලබා දෙනු ලැබේ). මෙම කටයුත්ත කිරීමට අවශ්‍ය පහසුකම් අදාළ ආරණ්‍යයේ නැත්නම් වෙනත් පිටස්තර පින්වතකුගේ උදව්වෙන් මෙම කටයුතු කිරීමට අවශ්‍ය උපකාර අප විසින් දෙනු ලැබේ.

6. එම ඉල්ලුම් කරන ලද දානය එම පුද්ගලයාට ලබා දිය හැකි නම්, එම පුද්ගලයාට ආරණ්‍යයේ බැංකු විස්තර, ස්වාමීන් වහන්සේලා සිටිනා ගණන හා ආරණ්‍ය ගැන විස්තර දන ගත හැකි දෙදෙනකුගේ දුරකථන අංක විද්‍යුත් ලිපිනය මගින් දැනුම් දෙනු ලැබේ.

7. එවිට එම පුද්ගලයාට දානය සඳහා වැය වන මුදල අදාළ බැංකු ගිණුමට බැර කල හැකයි.

8. එම පුද්ගලයා දානය ආරණ්‍ය සේනාසනයට ගෙන ඒමට කැමති නම් ඒ බව දානය ඉල්ලුම් කරන අවස්ථාවේ දීම අදාළ ආරණ්‍යයට දැනුම් දිය හැක. එම දාන ආරණ්‍යයේ පිළියෙළ කිරීම හෝ ආරණ්‍ය සේනාසනයට රැගෙන ඒම අදාළ දායකය විසින් කරනු ලැබේ.

9. ආරණ්‍යයට ලැබෙන්නේ දානය සඳහා මුදල් ආධාරයක් නම්, දානය නියමිත දින එම මුදල් යොදවා දානය සකස් කර ගැනීමට ආරණ්‍ය සේනාසනයට හැකි වනු ඇත.

10. දානය දුන් පසු, දානය දුන් පුද්ගලයා සඳහා කරන ලද පුණ්‍යානුමෝදනාව ආරණ්‍ය සේනාසනය වෙතින් වෙබ් අඩවියට එවිය යුතු ය. පුණ්‍යානුමෝදනාව video/audio සහ photo විය යුතු ය(මෙම

DANAPARAMITHA

පුණ්‍යානුමෝදනාව video/audio සහ photo වීම මගින් දායකයා තුල වඩාත් හොඳ පැහැදීමක් හා ප්‍රීතියක් ඇති කිරීමෙන් මෙම දානයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙහි අරමුණයි. මෙම ක්‍රම වලින් පුණ්‍යානුමෝදනාව කල නො හැකි නම් පමණක් පුණ්‍යානුමෝදනාව ලිපියකින් කල හැක. එම පුණ්‍යානුමෝදනාව අප විසින් අදාළ දායකයා වෙත යවනු ලැබේ.

මෙය පින් පිණිස කරන, කිසියම් හෝ මූල්‍යමය ලාබයක් අපේක්ෂාවෙන් තොරව කරණ සත්කාරයකි. මෙහි දී දායකයාට ආරණ්‍ය සේනාසනයට දානය දිය හැකි දවස් පෙන්නා දීම, එම ආරණ්‍ය සේනාසනයට ඒ බව දැනුම්දීම, ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ අදාළ පුණ්‍යානුමෝදනාව දායකයාට ලබා දීම හැර වෙන වගකීම් කිසිවක් අප විසින් දරනු නො ලැබේ. නමුත් ඇතිවිය හැකි අඩුපාඩු කම් සකස් කර ගැනීමට කටයුතු කල හැක.

මෙම සත්කාරය වෙනුවෙන් දානමය කටයුතු සඳහා ලොව වටා සිටින බෞද්ධයන්ට ඉඩ ප්‍රස්ථා සලසා දී ඔවුන්ට පින් රැස් කර ගැනීම සඳහා අවස්ථාව උදා කර දෙන මේන් ද ශාසනාලයෙන් යුතුව දන්වා සිටිමු.

මෙම පුණ්‍ය කර්මය සඳහා ඔබ වහන්සේලාගේ ආරණ්‍ය සේනාසනය දායක වන්නේ නම් කරුණාවෙන් අපට දැනුම් දෙන්න. එමෙන්ම ඔබ වහන්සේලාගේ අදහස් උදහස් අප වෙත දැනුම් දෙන්න. මෙම කටයුත්ත සඳහා ආරණ්‍ය සේනාසනයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා වෙනත් ලියුමකින් දන්වනු ඇත.
තෙරුවන් සරණයි !

………………………………………………………………………….

සාසන ලැදි විජේමාන්න විදානලාගේ
සංවිධායක කමිටුව වෙනුවෙන්
විද්‍යුත් ලිපිනය (වඩාත් පහසුයි): danaparamithawa@gmail.com
දූරකථන අංකය: +61425358080
31/10/2022